සිජ්/6/1/2/05 2024.07.25

සියළුම සංස්කෘතික මධ්‍යස්ථාන භාර නිලධාරීන් වෙත

**අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා නර්තන/ සංගීත සහ චිත්‍ර තරගාවලිය - 2024**

අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා නර්තන, සංගීත සහ චිත්‍ර තරගාවලිය 2024 වර්ෂය සඳහා ද පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

02. සියළුම සංස්කෘතික මධ්‍යස්ථාන මෙම තරගාවලිය සඳහා අනිවාර්යයෙන්ම ඉදිරිපත් විය යුතු අතර, ඒ සඳහා සකස් කරන ලද චක්‍රලේඛ සහ ඊට අදාල ආදර්ශ අයදුම් පත්‍ර මේ සමඟ අමුණා ඇත.

03. නර්තන/සංගීත චක්‍රලේඛ සමග අමුණා ඇති අයදුම් පත්‍ර (අංක 01 සිට 06 දක්වා) නිසි පරිදි සම්පූර්ණ කර අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර (අවසන් දින අදාළ චක්‍රලේඛවල දක්වා ඇත) ප්‍රවර්ධන අංශය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

04. නර්තන/සංගීත පළාත් තරග පැවැත්වෙන දින උදෑසන තරග සංවිධායක නිලධාරීන්ට ස්ථානභාර නිලධාරී විසින් සහතික කරන ලද අයදුම්පත් භාර දිය යුතු අතර, පෙර එවන ලද අයදුම්පතෙහි තොරතුරු අතර පරස්පරතාවක් නොතිබිය යුතුය.

05. නර්තන/සංගීත පළාත් තරග පවත්වන දිනයන් ඇතුලත් කාලසටහන හා තරග ශීර්ෂ පිළිවෙල ඉදිරියේ දී ලැබීමට සලස්වනු ඇත.

06. චිත්‍ර නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී ඒ ඒ තරග කාණ්ඩ යටතේ මධ්‍යස්ථාන මට්ටමින් එක් කාණ්ඩයකින් නිර්මාණ 05 බැගින්, පළාත් වටය සඳහා අමාත්‍යාංශය වෙත එවිය යුතුය.



**තිලක් නන්දන හෙට්ටිආරච්චි**
අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට